**2022.11.10 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | | |
|---|---|---|---|
| 1. | බී. කන්දසාමි මයා | - | ගරු සභාපති |
| 2. | වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. | එස්. සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. | ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. | කේ.ජේ.සී. කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. | ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. | ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 8. | එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. | සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. | එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 11. | මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 12. | තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. | වේලුසාමි එලීල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 14. | එච්.ජී.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 15. | එම්.ජී. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 16. | ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

**01.පසුගිය රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.10.14 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙහි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සහා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සහා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන**

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා</u>
  ග්ලැනනෝර් ඉන්දියන් නව නිවාස ව්‍යාපෘතිය සඳහා පිවිසෙන මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති ලිපිය

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා</u>

යහළබැද්ද කන්දෙ අරාව යායට පිවිසෙන මාර්ගය පිළිසකර කිරීමේ දී අවශ්‍ය වන මැටල් කියුබ් එකක් ලබා දෙන ලෙසට ඒ.එම්. ජයසේකර මහතා විසින් ඉල්ලීම් සිදු කර ඇති ලිපිය

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කන්දසාමි මහතා</u>

  දඹෙතැන්න වත්ත ඩීබීටී කොටස ශ්‍රී මුත්තු මාරියම්මන් කෝවිලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වී ඇති බැවින් ඊට අවශ්‍ය සිමෙන්ති මිටි 100ක් ලබා දෙන ලෙසට ශ්‍රී මුත්තු මාරියම්මන් කෝවිලේ කාරක සභාව විසින් ඉල්ලීම් සිදු කර ඇති ලිපිය

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

දියතලාව නව වෙළඳ සංකීර්ණයේ දෙවන මහලෙ හි පවත්වාගෙන යන කඩ කාමර 4හි 2020.01.01සිට 2022.12.31 දක්වා පනවා තිබූ බදු ගිවිසුම් කාලය 2022.12.31 වන දිනෙන් අවසන් වන බැවින් හා දියතලාව පොදු වෙළඳපොලෙ හි පවත්වාගෙන යන කඩ කාමර 16 හි 2021.01.01 සිට 2022.12.31 දක්වා පනවා තිබූ බදු ගිවිසුම් කාලය ද 2022-12-31 වන දිනෙන් අවසන් වන බැවින් එම බදු ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සුදුසු බවත් බදු මුදල ලෙස පැවති මුදලම ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල්. සුදර්ශන මහතා</u>

<u>විවාද</u>

දියතලාව නව වෙළඳ සංකීර්ණයේ දෙවන මහලෙ හි පවත්වාගෙන යන කඩ කාමර 4හි 2020.01.01සිට 2022.12.31 දක්වා පනවා තිබූ බදු ගිවිසුම් කාලය 2022.12.31 වන දිනෙන් අවසන් වන බැවින් හා දියතලාව පොදු වෙළඳපොලෙ හි පවත්වාගෙන යන කඩ කාමර 16 හි 2021.01.01 සිට 2022.12.31 දක්වා පනවා තිබූ බදු ගිවිසුම් කාලය ද 2022-12-31 වන දිනෙන් අවසන් වන බැවින් එම බදු ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සුදුසු බවත් බදු මුදල ලෙස පැවති මුදලම ලබා ගැනීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

පළාත් පාලන කොමසාරිස් ගේ අංක 12/9/3/3/iii හා 2022-10-12 හා දිනැති ලිපියට අනුව දියතලාව නගරයේ වාහන හා පොළ බදු ගිවිසුම් කාලය වන 2021-10-05 සිට 2022-10-06 දින දක්වා කාලසීමාව තුළ ආර්ථික අර්බුදකාරී තත්ත්වය මත ටෙන්ඩර් මුදල අඩු කිරීමට ගත් තීරණය පහත සඳහන් ආකාරයට නැවත සංශෝධනය විය යුතු බැවින් එකී සංශෝධන යෝජනා පහත සඳහන් පරිදි සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

I. 2022-06-30 හා 2022-07-01 දිනයන්ට අදාලව රු.4,140.00ක මුදල පොත්වලින් කපා හැරීම සුදුසු බව ,

II. 2022-07-19 දින සිට බදු කාල සීමාව අවසන් වන 2022.10.06 දින දක්වා කාලය සඳහා අය කරනු ලබන බදු මුදල 25% ක ප්‍රතිශතය වන රු.40,365.00ක මුදල පොත් වලින් කපා හැරීම සුදුසු බව,

III. ඒ අනුව පොත්වලින් කපා හැරිය යුතු මුළු මුදල වන රු.44,505.00 ක මුදල පොත්වලින් කපා හැරීම සුදුසු බව,

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

පළාත් පාලන කොමසාරිස් ගේ අංක 12/9/3/3/iii හා 2022-10-12 හා දිනැති ලිපියට අනුව දියතලාව නගරයේ වාහන හා පොළ බදු ගිවිසුම් කාලය වන 2021-10-05 සිට 2022-10-06 දින දක්වා කාලසීමාව තුළ ආර්ථික අර්බුදකාරී තත්ත්වය මත ටෙන්ඩර් මුදල අඩු කිරීමට ගත් තීරණය පහත සඳහන් ආකාරයට නැවත සංශෝධනය විය යුතු බැවින් එකී සංශෝධන යෝජනා පහත සඳහන් පරිදි සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

I. 2022-06-30 හා 2022-07-01 දිනයන්ට අදාලව රු.4,140.00ක මුදල පොත්වලින් කපා හැරීම සුදුසු බව ,

II. 2022-07-19 දින සිට බදු කාල සීමාව අවසන් වන 2022.10.06 දින දක්වා කාලය සඳහා අය කරනු ලබන බදු මුදල 25% ක ප්‍රතිශතය වන රු.40,365.00ක මුදල පොත් වලින් කපා හැරීම සුදුසු බව,

III. ඒ අනුව පොත්වලින් කපා හැරිය යුතු මුළු මුදල වන රු.44,505.00 ක මුදල පොත්වලින් කපා හැරීම සුදුසු බව,

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව තුළ වරිපනම් ගෙවනු ලබන පුද්ගලයින් විසින් උපලේඛනයේ සඳහන් පරිදි වසර දෙකකට වඩා වැඩි හිඟ ශේෂ පවතින වරිපනම් හිමියන් සඳහා දේපල තහනම් කිරීම සිදු කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව තුළ වරිපනම් ගෙවනු ලබන පුද්ගලයින් විසින් උපලේඛනයේ සඳහන් පරිදි වසර දෙකකට වඩා වැඩි හිඟ ශේෂ පවතින වරිපනම් හිමියන් සඳහා දේපල තහනම් කිරීම සිදු කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 දෙසැම්බර් මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

2022 දෙසැම්බර් මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස දෙසැම්බර් 13 වන දිනය තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.සභාවේ කල් දී නොමැති යෝජනා**
**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ කාර්ය සාධන අරමුදල් -2 වැඩසටහනට අදාලව හපුතලේ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා ප්‍රමුඛතා ගත කරන ලද අතර ඇමුණුමේ සඳහන් එකී යෝජනා 14 සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.
ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ කාර්ය සාධන අරමුදල් -2 වැඩසටහනට අදාලව හපුතලේ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා ප්‍රමුඛතා ගත කරන ලද අතර ඇමුණුමේ සඳහන් එකී යෝජනා 14 සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද සමීක්ෂණ මණ්ඩල සභාපති ඇතුළුව පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩළය පත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

I. විමර්ෂණ නිලධාරිණී ඩබ්.එම්. මාලනී වීරසිංහ මහත්මිය - සමීක්ෂණ මණ්ඩල සභාපති
II. ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි කේ.ජේ.එම්. ඩී.අනුර බණ්ඩාර මහතා - සාමාජික
III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය - සාමාජික
IV. සංවර්ධන නිලධාරි පාලිත ජයසුන්දර මහතා - සාමාජික
V. සංවර්ධන නිලධාරි මල්ලිකා ධර්මරාජා මහත්මිය - විෂය නිලධාරි

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. සී.කේ. පෙරේරා මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද සමීක්ෂණ මණ්ඩල සභාපති ඇතුළුව පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩළය පත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

I. විමර්ෂණ නිලධාරිණී ඩබ්.එම්. මාලනී වීරසිංහ මහත්මිය - සමීක්ෂණ මණ්ඩල සභාපති
II. ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි කේ.ජේ.එම්. ඩී.අනුර බණ්ඩාර මහතා - සාමාජික
III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය - සාමාජික
IV. සංවර්ධන නිලධාරි පාලිත ජයසුන්දර මහතා - සාමාජික
V. සංවර්ධන නිලධාරි මල්ලිකා ධර්මරාජා මහත්මිය - විෂය නිලධාරි

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ගල්කන්ද වත්තෙහි පදිංචි අඩු ආදායම්ලාභී එස්. රවිචන්ද්‍රන් මහතා ගේ නිවස හදිසි ගිනි ගැනීමට ලක් වීම හේතුවෙන් හානි සිදු වූ නිවසේ විදුලි පරිපථ පද්ධතිය පිළිසකර කර ගැනීම සඳහා ආධාර මුදලක් ලෙස කාර්මික නිලධාරි ඇස්තමේන්තු ප්‍රකාරව රු. 28,615.00ක මුදල සභා අරමුදල් දරා අදාළ ද්‍රව්‍යාධාර ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

හපුතලේ ගල්කන්ද වත්තෙහි පදිංචි අඩු ආදායම්ලාභී එස්. රවිචන්ද්‍රන් මහතා ගේ නිවස හදිසි ගිනි ගැනීමට ලක් වීම හේතුවෙන් හානි සිදු වූ නිවසේ විදුලි පරිපථ පද්ධතිය පිළිසකර කර ගැනීම සඳහා ආධාර මුදලක් ලෙස කාර්මික නිලධාරි ඇස්තමේන්තු ප්‍රකාරව රු. 28,615.00ක මුදල සභා අරමුදල් දරා අදාළ ද්‍රව්‍යාධාර ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වර්තාව**

2022.11.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 ඔක්තෝබර් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-11-10 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයන් වෙත අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

**08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි,මාර්ග හා කාණු පද්ධති සම්බන්ධ වර්තමාන තත්ත්වය ඉතා කනගාටුදායක බවත් ප්‍රජාව විසින් කුණු කසළ ගෙනවිත් දමන බැවින් සුසාන භූමි අපිරිසිදුව ඇති බවත් , අවහිරව පවතින කාණු පද්ධති හේතුවෙන් මාර්ග හරහා ජලය ගලා යැමෙන් මාර්ග අබලන් බවට පත් වී ඇති බවත් , ඉතා කඩිනමින් එකී සුසාන භූමි,මාර්ග හා කාණු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙම දිනවල ක්‍රියාත්මක වන ජංගම සේවයට සමගාමීව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි,මාර්ග හා කාණු පද්ධති පිළිසකර කිරීම සඳහා වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කළ යුතු බවත් ,හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි හඳුනා ගෙන එකී සුසාන භූමි සුද්ධ පවිත්‍ර කිරීම සඳහා දින වෙන් කර අවශ්‍ය පරිදි සැලසුමක් සකස් කර අදාළ වසම භාර ප්‍රාදේශීය සභා නියෝජිතවරයා හෝ නියෝජිතවරිය දැනුවත් කිරීම හා අවශ්‍ය පරිදි වැඩපිළිවෙල සැලසුම් කර ගන්නා ලෙස ග්‍රාම සංවර්ධන සමිතිය / අවමංගල්‍යාධාර සමිතිය දැනුවත් කර ලබන සඳුදා සිට සතියට දින දෙකක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් දියතලාව බස් නැවතුම්පොළ භූමියෙහි වැසිකිළි පද්ධතියෙහි ඉදි කිරීම් කටයුතු මේ වනතුරු නිම වී නොමැති බවත් කාණු පද්ධතිය අවහිර වීම හේතුවෙන් ප්‍රජාව අපහසුතාවයට පත් වන බැවින් එකී කාණු පද්ධතිය සුද්ධ පවිත්‍රකර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වැසිකිළි පද්ධතියෙහි ඉදි කිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බවත් කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් පළාත් පාලන මැතිවරණය ඉදිරියේ දී පැවැත්වීම පිළිබඳ ප්‍රජාව බලාපොරොත්තුවෙන් සිටින බවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය 8000 සිට 4000 දක්වා අඩු කිරීමට ගරු ජනාධිපතිතුමන් විසින් කමිටුවක් පත් කර මේ දිනවල වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කළ අතර පළාත් පාලන මන්ත්‍රීවරු විසින් ලබා දෙන යෝජනා පළාත් පාලන කොමසාරිස්තුමන් , පලාත් පාලන අමාත්‍යවරයා වෙත ලබා දීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කළ අතර පළමු යෝජනාව ලෙස නීතියට අනුව සෑම ග්‍රාම සේවා වසමකටම ග්‍රාම නිලධාරිවරයෙක් අනිවාර්යයසේම හපුතලේ ආසනය බහු අසනයක් වුව ද දඹේතැන්න වත්ත වැනි මිනිසුන් 6700ක් පමණ සිටින වසම් සම්බන්ධයෙන් සළකා බැලීමේ දී කොට්ඨාස ක්‍රමයට අඩු කරනවා නම් ග්‍රාම සේවා වසම පුළුල් කළ යුතු බවත් යෝජනා කළ අතර දෙවැනි යෝජනාව ලෙස කොට්ඨාස සීමා බෙදා ගැනීමේ මායිම් සකස් කිරීමේ දී ග්‍රාම නිලධාරිවරයාගේ සහයෝගය ලබා ගෙන මෙම සීමා මායිම් වෙන් කිරීම සිදු කළ යුතු බවත් යෝජනා කරන ලදී.

එසේම හපුතලේ සිට ග්ලැනනෝර්වත්ත පාර දෙපසම මෙන්ම ගස්පහ දේවාලය අසළ කුණු කසළ දමන බවත් කුණු / පොලිතීන් වැනි දෑ ආහාරයට ගැනීමෙන් රිලවුන් මිය යන බවත් මේ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කරන ලෙසත්, පසුගිය දිනක ග්ලැනනෝර් වතු කළමණාකරු විසින් ඉවත විසිකර තිබූ ඩයලොග් කාඩ්පත භාවිතා කර තිබූ පුද්ගලයාට විරුද්ධව නඩු පැවරූ බවත් ,ගස්පහ දේවාලය සඳහා කසළ බඳුන් 03ක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඉදිරියේ දී ශ්‍රමදාන සිදු කිරීමේ දී ග්ලැනනෝර් මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීම ද ඊට ඇතුළත් කළ යුතු අතර හපුතලේ ප්‍රජා පොලීසිය ද ඊට කැඳවීම සුදුසු බවත් කසළ ගෙනවිත් දමන පුද්ගයලන් සම්බන්ධයෙන් වගකීම ප්‍රජා පොලීසිය වෙත පැවරීම සුදුසු බවත් කුණු කසළ ගෙනවිත් දමන පුද්ගලයින් අල්ලා නීතිය හමුවට පැමිණවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලද අතර ගස්පහ දේවාලය සඳහා කසළ බඳුන් 03ක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් වතු කළමණාකරීත්වය සමඟ සාකච්ඡා කර ට්‍රැක්ටර් රථය මගින් ගස්පහ දේවාලයේ රැස්වන කසළ රැගෙන යාමට වැඩපිළිවෙළක් සකස් කර ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී. එලීල් අරසි මහත්මිය අදහස් දක්වමින් පිටරත්මලේ පහළ කොටසෙහි දෙවන වතාවටත් ගස් කැපීම ආරම්භ කර ඇති බවත් මෙම දැව මෙකී මාර්ගය හරහාම යළිත් ප්‍රවාහනය සිදු කළ හොත් මාර්ගය අබලන් වීම සිදු වන බවත් පසුගිය වර ප්‍රවාහනය කිරීමට පෙර රු.25,000.00 ක තැම්පතුවක් තබා ඇති බවත් තමන් 2019 වර්ෂයේ සිට මේ දක්වා සභාව තුළ මේ සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කළ බවත් මෙවර ද ගස් කැපීම ආරම්භ කර ඇති බවත් එකී දැව ප්‍රවාහන කටයුතු සඳහා මෙම මාර්ගයම භාවිතා කරන්නේ නම් තමා ඒ සම්බන්ධයෙන් විරුද්ධතාවය ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දැව ප්‍රවාහන කටයුතු සඳහා මෙකී මාර්ගය භාවිතා නොකරන ලෙස අදාළ පාර්ශය දැනුවත් කළද විපකල්ප මාර්ගයක් නොමැති වීමෙන් එසේ සිදු කළ නොහැකි බැවින් එක් වරකට එක් ගසක් පමණක් බැගින් ප්‍රවාහන කටයුතු සිදු කර ගන්නා ලෙස අදාළ පාර්ශව දැනුවත් කරන බවත් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා විසින් අදහස් දක්වමින් එළඹෙන 5 වසර ශිෂ්‍යත්ව විභාගය මූලික කර ගනිමින් ප්‍රාදේශීය සභා මැදිහත්වීම මත ජනප්‍රිය ගුරුවරුන් සම්බන්ධ කර ගනිමින් ප්‍රාදේශීය සභාවට අයත් සියලුම පාසල් දැනුවත් කර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු යෙදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.එසේම පසුගිය දිනක වීථි පහන් දෙකක් යහළබැද්ද මාර්ගයට ලබා දීම සම්බන්ධයෙන් සතුට ප්‍රකාශ කරන බවත් ලබා දීමට නියමිත ඉතිරි වීථි පහන්

ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.එසේම මාර්ග පද්ධති , කාණු පද්ධති, සොහොන් පිළිසකර කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම කැපවීමෙන් සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.තවද දියතලාව මහ විද්‍යාලයේ මාර්ගය දෙපස කාණු පද්ධතිය මේ වන විට සකස් කර ඇති බවත් සුළු ප්‍රමාණයක් පමණක් ප්‍රතිපාදන හිඟ වීම මත නතර කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා අවධානය යොමු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා විසින් අදහස් දක්වමින් වැඩිහිටි දීමනාව ලබා දීමේ දී අත් පොත තිබෙන සියලුම දෙනාහට රු.5000.00ක මුදලක් ලබා දුන් බවත් අත් පොත් නොමැති අයහට රු.200.00ක දීමනාවක් පමණක් ලබා දුන් බවත් මේ වන විට රු.200.00ක දීමනාව ලබා නොදෙන බවත් නිවැරදි තොරතුරු ලබා නොදීම හේතුවෙන් වැඩිහිටි ප්‍රජාව අපහසුතාවයට ලක් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත් වීම මත අඩු ආදායම්ලාභී පුද්ගලයින්ගේ දත්ත හා තොරතුරු ලබා ගැනීම සඳහා මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කටයුතු සිදු කර ගෙන යන බවත් නිලධාරීන් විසින් එකී දත්ත රැස් කිරීමේ දී එකී කටයුතු ක්‍රමානුකූලව සිදු නොවන බවත් පංකැටිය වත්තෙහි නිලධාරීන්ගේ මැදිහත් වීම මත සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කර ඇති අතර කහගල්ල වත්තෙහි සියලු දත්ත හා තොරතුරු සුභ සාධක නිලධාරීතුමන්ගෙන් ලබා ගෙන ඇති බවත් නිවෙස් වෙත ගොස් තොරතුරු ලබා ගෙන නොමැති බවත් , ප්‍රජාව විසින් මේ සම්බන්ධයෙන් විමසීමේ දී දරිද්‍රතාවයෙන් වැඩි මට්ටමක සිටින අයගේ නිවෙස් පමණක් සමීක්ෂණය කළ බව ප්‍රකාශ කළ බවත් ,එසේ නම් දරිද්‍රතාවයෙන් වැඩි පිරිස් තේරීමට ලක් කරේ කෙසේ ද යන්නත් විමසන ලද අතර මින් ඉදිරියට මෙවැනි සමීක්ෂණ සිදු කිරීමේ දී නිවෙස්වලට ගොස් නිවැරදි දත්ත හා තොරතුරු ලබා ගන්නා ලෙස අදාල පාර්ශව දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සමෘද්ධි සහනාධාර හා වැඩිහිටි දීමනාව සඳහා වෙන්වූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ අතර මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් දැනුවත් වීම සඳහා සමෘද්ධි අධ්‍යක්ෂකතුමන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රැස්වීම් පැවැත්වීමේ දී දින තුනකට හෝ පෙර ගරු සභික මණ්ඩලය දැනුවත් කිරීම් සිදු කරන ලෙසට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කරන ලෙසත් ප්‍රජාවට බොහෝ ගැටලුවක්ව පවතින රිලවුන් සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලෙසත් පුස්තකාලය අවට පරිශ්‍රයේ ඇති දර ඉවත් කර එකී පරිශ්‍රය සුද්ධ පවිත්‍ර කරන ලෙසත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාහර් මහතා විසින් අදහස් දක්වමින් මෙම දිනවල ක්‍රියාත්මක වන සුනඛ එන්නත්කරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත ස්තූතිය ප්‍රකාශ කරන බවත් , සුනඛ වන්ද්‍යාකරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ඖෂධ සභාවේ මැදිහත් වීම මත මිලදී ගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත ලබා දෙන්නේ නම් එකී කටයුතු සිදු කළ හැකි බව එම ආයතනය මගින් දැනුම් දුන් බවත් හැකියාව පවතී නම් එකී ඖෂධ මිලදී ගෙන ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

එසේම පසුගිය දිනක කනවරැල්ල වත්තෙහි විදුලි සැර වැදී මියගිය පුද්ගලයාට වන්දි මුදල ලෙස රු. ලක්ෂ 40ක මුදලක් හිමිවූ බවත් ඩයගම ප්‍රදේශයේ මිය ගිය තිදරු පියා වෙනුවෙන් වන්දි මුදල ලෙස රු.ලක්ෂ 45 ක මුදලක් ගෙවීමට ගිවිසුම් ගත වී ඇති බවත් පාර්ලිමේන්තුව තුළ ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් අදහස් පළ කර මෙවැනි ඉල්ලීම් දිනා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන ද්‍රවිඩ මන්ත්‍රීවරුන් පිළිබඳව ආඩම්බර වන බවත් එකී මන්ත්‍රීවරුන් වෙත ස්තූතිය ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.එසේම මෙවැනි හදිසි අනතුරුවලට ලක් වී මිය යන පුද්ගලයින් හට වන්දි ලබා දීම සිදු කිරීමට වඩා හදිසි අනතුරු වැළැක්වීමට අවශ්‍ය කටයුතු කිරීම මහඟු ක්‍රියාවක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එස්. සගාදේවන් මහතා විසින් අදහස් දක්වමින් තමන් පසුගිය දිනෙක පළාත් පාලන කොමසාරිස්තුමන් හමු වූ බවත් එහිදී සාකච්ඡා සිදු කිරීමේ දී මාර්ග අලුත්වැඩියා කටයුතු සභාව මැදිහත් වීම මත සිදු කළ හැකි බව පැවසූ බවත් ඒ වෙනුවෙන් ප්‍රතිපාදන පළාත් පාලන ආයතන සතුව පවතින බව ප්‍රකාශ කළ බවත් සඳහන් කරන ලදී. එසේම ග්ලැනනෝර් කාපට් මාර්ගය පසුගිය දිනක බණ්ඩාරවෙල අයි රෝඩ් මාර්ග ඉදි කිරීම් කාර්යාලය විසින් නිරීක්ෂණයට ලක් කර ඇති බවත් මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් මැදිහත් වී සොයා බලා අවධානය යොමු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය

ලේකම් කාර්යාලය විසින් යෝජනා ලබා ගැනීමේ දී ගරු මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කිරීමක් සිදු නොකරන බවත් සුහ සාධක නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගන්නා බවත් මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය දැනුවත්භාවයක් නොමැති බවත් ප්‍රකාශ කළ අතර සවි කරන ලද විදී ලාම්පු අක්‍රීය වී ඇති බැවින් නව විදී ලාම්පු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.